# සංක්‍රමණිකයකුගේ සටහන

## ඩී. බී. සමුගත් පසු

හොඳ මිනිසෙක් අපෙන් සදහටම සමුගත් පසු ලෝකයා ඔහු ගැන බොහෝ පැවසීමට පෙළඹීම ස්වභාවිකයි. සමුගත් පසු ගුණ වැයීම ඔහුට පලක් නැති වුවත් ඒක හොඳ දෙයක්. මේ වන විට ඩී. බී. විජේතුංග මහතා ගැනත් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා බොහෝ දේ කියවෙමින් තිබෙනවා. ඩී. බී. නම් අවංක මිනිසා, නිහතමානී මිනිසා, ගැමියා, නිරහංකාර මිනිසා ආදී ලෙස නොයෙක් අන්දමින් ඔහුව හැඳින්වෙනවා. මේ කරන සෑම හැඳින්වීමක්ම සත්‍යයක් හා ඔහුට ගැලපෙන බවට අපත් එකඟ වෙනවා. ඒත් මේ දේවල් දැං කියන දේසපාළුවන් හා මාධ්‍යකරුවන්ම 80-90 දශකයේදී ඔහුව හැඳින්වීමේදී නමේ මුලට "පිං" වචනය යොදා ගත් අයුරු සිහිවන විට මේ මහත්වරු ගැන අපට තිබෙන්නේ දුකක්. ජ්‍යේෂ්ඨත්වය හා පලපුරුද්ද හරහා ඔහු ලැබූ බොහෝ තනාන්තර පිළිබඳව එදා මේ මිනිසුන්ම හැඳින්වීම කලේ කෙලෙසද? ලෝකේ හැටි එහෙම තමයි. කෙසේ වුවත් අප නම් ඔහු දකින්නේ දේශපාලනය ද්වේශපාලනයක් කර නොගත් පරපුරක ඉතිරිවී ඇති අන්තිම පුරුක් කීපයකින් එකක් ලෙසයි. මේ පුරුක් ටිකක් අපට අහිමි වූ දා ඉතිරිවන දේ ගැන කුමට කතාද?

## සීත රෑ වසන්තේ

සනත්-මල්කාන්ති+බොලොසම්ස් ප්‍රසංගය කලකින් දුට හොඳ සංගීත ප්‍රසංගයක් ලෙස නොබියව හඳුන්වන්න පුළුවන් ඒකට හේතු දෙකක් තිබුණා. එකක් සනත්ගේ ගැඹුරු ලයාන්විත ගීත ගායනය අනෙක බොලොසවිලගේ සංගීතය. කිසි අවුලක් නැහැ දෙක නියමෙට ගැලපුනා. මට නම් හිතෙන්නේ විජිතලා මෙතෙක් කරපු හොඳම ප්‍රසංගය තමයි ඒක. එක දිගටම ප්‍රසංග තිබුනත් මිනිස්සු මේවා බලන්න අමාරුවෙන් හරි එන එක වටිනවා. ගීතයක ශබ්ද රසය හා අර්ථ රසය දෙකම සමයේ ලැබිය හැකි අවසන් කාල වකවානුවටයි. අපි දැන් සේන්දුවෙමින් පවතින්නේ. මේ ගායන පරපුර අහිමි වූ දුක අපට හිමිවන්නේ ශබ්ද රසය හා නර්ථනයම පමණයි. ඒ නිසා රටින් දුරස් වී ඉන්න අපිට ඉඳ හිට ලැබෙන මේ වගේ අවස්ථාවලින් ප්‍රයෝජනය ගන්න එක ජීවිතයට බොහෝ වටිනවා.

## ගුරු දිනය ඔක්. 06

"හොඳ ගුරුවරයා වූ කලී ක්‍රම ක්‍රමයෙන් තමන් අනවශ්‍ය වන පරිදි සිය රාජකාරිය ඉටු කරන්නාවූ පුද්ගලයා" බව තෝමස් කුරුක්සේ පැවසුවද ඒ කාර්යය නිසි ලෙස යෙදීමට තරම් විවේක බුද්දියක් අද ගුරුනට තිබේද? ආර්ථිකය විසින් ඇති කරන ලද පීඩාව හමුවේ ඔවුන්ට තමන්ගේ ජීවිත පවත්වාගෙන යාමට අවශ්‍ය අවම පහසුකම් හෝ නොමැත. එනිසා තම ජීවිත පවත්වාගෙන යාම කෙරෙහි අවධානය යොමු කිරීමට සිදුවීම විනා තම සේවය ගැන හෝ තම දැනුමේ දියුණුව ගැන සිතීමට බුරුතු පිටින් බිහිවන්නේ එබැවිනි. ජාතියේ දරුවන්ගේ දෑස් පාදා ඔවුන් යහමගට ගන්නාවූ ගුරුවරුන් ජාතියේ ආරක්ෂකයන් බඳුය. ඒ ගුරු පරපුර රැක ගැනීම හා ඔවුන්ගේ කාලය ශක්තිය අපතේ නොයන පරිදි සේවය මනා ලෙස හා ප්‍රතිඵලදායක ලෙසින් යොදවා ගැනීම හා ගුරු සේවයේ පරමාර්ථ හා අයිතිවාසිකම් රැක බලා ගැනීම පාලකයන් සතු යුතුකමකි. ඒ යුතුකම් ඉටු කරවා ගැනීම සඳහා පනවා ඇති නිර්දේශ මාලාවක් ඉදිරිපත් කර දශක 4ක කාලයක් ගත වුවද ගුරුවරුන්ට තවමත් බෙදෙන්නේ පරන හැන්දෙන්ම වීම කෙතරම් ඛේදජනකද?

## ඔක්තොම්බර් හා ලෙනින්

දශක ගනනාවක් තිස්සේ අපට අසා පුරුදු සමාජවාදී සටන් පාඨ වල හඬ මේ වන විට තරමක් යට ගොස්, තිබුනද- එහි ඇති වලංගුභාවය නැති කිරීමට කිසිවෙකුට හැකියාවක් නැහැ. ලෝක දේශපාලන ඉතිහාසය තුල සමාජවාදය හා ඔක්තොම්බර් මාසය අතර ඇති සම්බන්ධය ඓතිහාසිකයි. ඒ මානව ඉතිහාසයේ යෝධ පියවරක් ඉදිරියට තැබූ 1917 වර්ෂයේ රුසියාවේ සිදුවූ ශ්‍රේෂ්ඨ රතු ඔක්තොම්බර් විප්ලවය නිසාය. ඔක්තොම්බර් විප්ලවයෙන් ඇරඹුන ප්‍රගතිශීලිත්වයේ ජීවන සුවය රුසියාව ඇතුළු සමස්ථ ලෝකය පුරා වියරනය කල යුග පුරුෂයා වූයේ ආදරනීය ලෙනින්. සහෝදරයායි. මිනිසුන් විසින්ම නෙලා මිනිසුන් විසින්ම ඔබගේ පිලිම නෙලා දැමුවද ලෝකය පුරා පීඩිතයන්ගේ සෑම සුසුමකම, යුක්තිය වෙනුවෙන් කෑගසන හඬේ දෝංකාරයක ඔබ සදා කල් ජීවත්වනු නිසැකය. මානව සංහතියේ ඓතිහාසික ජීවිත රටාව පුරා උසස් පරමාර්ථයන් වෙනුවෙන් නැගීසිට ඇත්තෙම්. ඔවුන්ගේ ඒ පරමාදර්ශී ක්‍රියා කාරීත්වයන් ලෝක ඉතිහාසය පිලිබඳ ලියවෙන හැම පත් ඉරුවකම සටහන් වනු ඇත.

## ගී සර ගී රස

සාමාන්‍යයෙන් ශ්‍රී ලාංකිකයෝ එකට එකතු කරලා සංවිධානයක ගොඩනගලා කාලයක් පවත්වාගෙන යන එක ලොකු අභියෝගයක් මෙහේ තියෙන සමිති සමාගම් වල ප්‍රමානයෙන් ඒක තේරුම් ගන්න පුළුවන්. එහෙම තත්වයක් තුල කලා කාරයෝ එකතු කරගෙන සංවිධානයක් ගොඩ නැගීමම අගය කල යුතු වැඩක් VASS එකට අපේ ප්‍රසාදය ඒ වෙනුවෙන් මේක හොඳ වැඩක් වෙන්නේ සංගීතය මහා ව්‍යාපාරයක් ලෙස මෙල්බර්න් වල තවම ස්ථාපිත වෙලා නැති නිසයි. CD එකක් අමාරුවෙන් තමන්ගේ මුදලින් කර ගත්තත් ඒක දිගටම කරන්න ආර්ථික හයියක් බොහොම දෙනෙකුට නැහැ. ඒ නිසාම VASS එකේ මේ වැඩේ කලා කරුවන්ට හොඳ අත්වැලක් මේක දිගටම කරගෙන යන්න ශක්තිය ලැබේවයි අපි පතනවා. එලෙසම මෙවර ගී සර ප්‍රසංගය ගැනත් යමක් කිව යුතුයි සිතුනා ප්‍රසංගයෙ ගී ගැයූ ශිල්පීන්ගේ ප්‍රසාංගික හැකියාව ගැන ගැටළුවක් නොතිබුනත් ප්‍රසංගය පුරාම යම් හුදෙකලා පාළු ගතියක් නම් දැනුනා වේදිකාව තුල ශිල්පීන් තනිවූ බවක් තමයි මට හැඟුනෙ. ඒ අනුව ශිල්පීය උපක්‍රමයකින් මගහරහා ගන්න තිබුනා හිතුනා. කෙසේ වුවත් VASS එකේ මේ ප්‍රසංගයට ඉදිරියටම යාමට සුභ පතනවා.

## ත්‍රිමා විතාරන

*ඔහු හිසට ඇණ ගසා මරා දමා විසි වසරක් ගෙවුණ දා*

මිටිය මා විය  
රැඳුණු දිනයක  
මිනීමරු ගහලයකු සුරතේ  
පහර දෙන විට  
තියුණු ඇණයක්  
තබා රන් දරුවකුගෙ සිරසේ  
දැනුණ සොව තව  
දවයි මා හද  
අසාපල්ලා මිනිස් සපුනේ  
ගනිව් මා මිට  
හෙළවි හෙණ සර  
සොයා ඒ තිරිසනා නොලසේ




# යුද මානසිකත්වය

ශ්‍රී ලාංකික බහුතර ජනතාව යුද මානසිකත්වයකින් පෙලෙන යුගයක අපි පසුවෙමු. ඉන් බොහෝ දෙනෙක් ජයග්‍රහණයේ උද්දාමයෙන් සිත් සතන් පුරවමින් අනිකුත් ප්‍රශ්න අමතක කළ සේයාවක් පෙනෙන්නට ඇත. සොල්දාදුවන්ගේ පය පොලවේ ගැටෙන රිද්මයට දවස ගෙවන බොහෝ දෙනෙක් රැය පහන් කළ සැනින් සතුරා හඹා යාමට තව කිලෝමීටර කීයක් ඇත්දැයි ගණන් බලමින්, තවත් බලාපොරොත්තු පොදි බැඳගත් අලුත් දිනයක් අරඹයි. කුසට ආහාර හා අනිකුත් මූලික අවශ්‍යතාවයන් අවම තරමින් වත් නැතිව, උද්දමනය අහස උසට නැග ගියත් ඒ ගැන අබමල් රේණුවක තරමින්වත් සැලකිරීමක් නොකිරීමට ජනතාව පෙළඹ සිටී. ජනතාව මෙතරම් පරාර්ථකාමීන් කල විරුවා කවුරුන්දැයි යම් කෙනෙක් විමසන්නේ නම්, මාගේ පිලිතුර වනුයේ රජයේ ග්‍රහණයට අසුවූ ඒක පාක්ෂික මාධ්‍ය මාපියාව එම විරුවා බවයි. ඊළඟ වැදගත්ම ප්‍රශ්නය වනුයේ තව කෙතරම් කාලයක් මෙම අන්දමන්ද ක්‍රියාවලිය කරගෙන යාහැකිද යන්නයි. රජය පවසන ආකාරයට තව මාස කීපයක් කරදරයක් නොමැතිව ජනතාවගේ කුස යුද රසයෙන් පිරවිය හැකිය.

කිලිනොච්චිය ඉතා ඉක්මනින් රජයේ හමුදා අතට පත්කර ගැනීමට බලාපොරොත්තු වන නිසා ඉදිරි මාස කීපය තුල අවශ්‍ය නම්, රජයට පාර්ලිමේන්තු මැතිවරණයක් හෝ ඉතිරි පලාත් සභා මැතිවරණ පවත්වා ජයග්‍රහණ ලබා ගැනීම ඉතා ලෙහෙසියෙන් කළ හැකි බව සඳහන් කළ යුතුය මෙසේ ලබා ගන්නා ජයග්‍රහණයන් ගේ උද්දාමයට සිරකර තබා ඇති ජනතාවගේ හිස මතට එම සියළුම ජයග්‍රහණ කඩා වැටීමේ අවදානමක අපි පසුවන බව ශ්‍රී ලංකාවෙන් හා අනිකුත් රාජ්‍යයන්ගෙන් ලැබෙන තොරතුරු ඉතා සියුම් විමර්ශණයකට ලක්කල විට පෙනෙන්නට ඇත. උදාහරණයක් ලෙස අපි සියළුම දෙනා දන්නනා පරිදි රජය විසින් නැගෙනහිර පලාත අත්පත් කර ගැනීම සලකා බලමු. ත්‍රස්තවාදීන් පරාජයකොට හෝ පලවාහැර නැගෙනහිර පලාත් රජය විසින් දෙවන වරටත් (මින් පෙර විජේතුංග ජනාධිපති සමයේදී) අල්ලා ගත්තා පමණක් නොව එහි පළාත් සභා ඡන්දය පවා පවත්වන ලදි. නමුත් ඉතාම කෙටි කාලයකට පසු අද අපි සියලුදෙනා බලාපොරොත්තු වූ පරිදි, සාමය ස්ථාපිතවීමක් සිදුවී නැත. පසුගිය කෙටි කාලය තුල පොලිස් හා හමුදා නිළධාරීන් 70වකට ආසන්න සංඛ්‍යාවක් ඇතුළුව රජයේ නිළධාරීන් හා සාමාන්‍ය වැසියන් ඝාතනය කරමින් නැවතත් ත්‍රස්තවාදය හිස ඔසවමින් පවතී. එසේ නම් රජය විසින් ජයග්‍රණය කර ඇත්තේ භූමිය පමණක් නොවන්නේද?. ඒ සඳහා කොපමණ මුදල් කන්දරාවක් වැය කරන්නට ඇතිද?. අහසයි පොළොවයි මෙන් අයවැය පරතරයක් ඇති ශ්‍රී ලංකාව වැනි රටක ආදායමෙන් රටවැසියන් බඩගින්නෙන් මුදවා තබාගෙන, අනිකුත් අවශ්‍යතා අවම තරමින් සපුරාලමින් රටේ සංවර්ධන ක්‍රියාවලිය ඉදිරියට ගෙනයාමට තරම් වත් ආදායමක් නොමැති බව අපි කවුරුත් හොඳින් දන්නා කරුණකි. එසේ නම් යුද්ධය කළ යුත්තේ ණයටය. ලෝකයේ කිසිම රටක් ශ්‍රී ලංකාව ත්‍රස්ත උවදුරෙන් බේරාගැනීම උදෙසා ණය ලබා දෙන්නේ නැත. ඒ සඳහා අපේ සම්පත් ඔවුන්ට ලියා දිය යුතුවේ. උදාහරණයක් ලෙස ඉන්දියාව පසුගිය දිනවල අපේ තෙල් සම්පත් ඇති ප්‍රදේශ ලියා ගත්තේය. එසේත් නැතිනම් ලෝකයේ ජාත්‍යන්තර බැංකුවලින් ඉතා වැඩි පොලියක් දී මුදල් ලබා ගත යුතුය. මේ අයුරින් කරන යුද්ධයක් අපේ රටට කෙසේ වත් ඔරොත්තු නොදෙන බව අවධාරණයෙන් කිව යුතුය. අනිත් අතට මෙසේ ණයට කරන යුද්ධයකින් ජනතාව දිනා ගන්නා දේ හා ජනතාවට අහිමිවන දේ ගැන තුලනාත්මක ඇගයීමක යෙදෙන්නට යොමුවන්නේ කීයෙන් කී දෙනෙක්ද?. අනිත් වැදගත්ම කාරණය වනුයේ කිලිනොච්චිය අල්ලා ගැනීමෙන් හෝ ප්‍රභාකරන් විනාශ කිරීමෙන් පසු මෙම ත්‍රස්තවාදී උවදුර ඉවර කළ හැකි බවට ජනතාව තුල ඇතිවී තිබෙන මිත්‍ය විශ්වාසයයි. ඒ එසේ නොවන්නේය.

රජයේ හමුදා ඉදිරියට යන විට භූමිය අතහැර පසුබසින ඔවුන් විහිදී විසිරී ගරිල්ලා සටන්වලට යොමුවනු ඇත. එය මුහුණට මුහුණලා කරන සටන් වලට වඩා අතිශය විනාශකාරීය. මෙය සාමාන්‍ය සිවිල් වැසියන්ට ඉතාමත් අහිතකරය. යුද්ධයක් පවතින රටකට වන තවත් බලවත්ම හානිය නම් නීතිය වල් වැදීම හා දුෂණය රජ කිරීමය. ජනතාවට තොරාංචියක් නොමැතිව උදේ සිටන් රෑ වන තුරු ඇස් කන් පිනවමින් "අහසෙත් අපි අපි පොලොවෙත් අපි අපි මුහුදෙත් අපි අපි" කියමින් ඉස කුඩිච්චි දමා ඇති නිසා රජය මානවා කලත් කමක් නැහැ යුද්ධය හරියට කරනවා යැයි කියනු, කී දෙනෙක්ගෙන් ඔබ අසා ඇත්ද? ලිපිය අවසන් කිරීමට ප්‍රථම කරුණු කිහිපයක් සිහිගැන්වීමට කැමැත්තෙමි. කොටි ත්‍රස්තවාදීන් විසින් පසුගියදා හයවන වරටත් ගුවනින් පැමිණ වවුනියා යුදහමුදා කඳවුරට හා රේඩාර් ජාලය විනාශ කර, පහර දීමෙන් ගම්‍ය වන්නේ භූමිය අතහැර පසුබැස ගියත් ත්‍රස්තවාදීන්ගේ බලය තවමත් ඉතා විනාශකාරී බවයි. ලෝකයේ සෑම බලපුලුවන්කාර කමක්ම හිමි රාජ්‍ය වන ඇමරිකාවේ ජනාධිපති ඉතා සාර්ථක ලෙස යුද්ධ දෙකක් කර ජය ගත්තේය. ඇෆ්ගනිස්තානයෙන් තලේබාන් වරු පන්නා දමා ඇමරිකානු රූකඩයක් එහිරජ කරවීය. ඉරාකයේ සදාම් හුසේන් සහ පුත් පරම්පරාව මරා දමා එහිද තම ගැත්තෙකු රජ කරවීය. ඒ සඳහා ඇමේරිකානු මිත්‍ර ලෙව අනිකුත් බලවත් රාජ්‍යයන් ද ඔහුට නොමඳ සහයක ලබා දුන්නෝය. නමුත් අද ඇතිවී තිබෙන තත්වය ගැන සිතා බලන විට, ජෝජ් බුෂ් ඔහු විසින් කරන ලද යුද්ධය ගැන දස දහස්වාරයක් පසුතැවෙනවාට නොඅනුමානය. ඇමෙරිකානු ජනතාව ඉතිහසයේ මෙතෙක් පත්වූ දරුණුම ආර්ථික අගාධයට පත් වී ඇති අතර ඉරාකයේ හා ඇෆ්ගනිස්තානයේ උත්සන්න වී ඇති ගරිල්ලා යුද්ධයට මුහුණදීමට නොහැකිව, ලොව දස අතට දෑත් දිගු කරමින් සිටී.

ඇමෙරිකානුවන්ට ජෝජ් බුෂ් දියත් කල යුද්ධයේ ප්‍රතිපල දැනෙන්ට වසර හතක් අටක් ගතවුවත්, ශ්‍රීලංකාවට නම් එතරම් කාලයක් ගතනොවන බව මා තරයේ විශ්වාස කරමි. එසේනම් ජය ගත යුත්තේ ජනතාව මිස, භූමිය නොවන්නේය. බොහෝ දෙනෙකුට අම්හිරි වුවද ලිපිය අවසන් කිරීමේ වාක්‍යයෙන් මා සඳහන් කරනුයේ ශ්‍රීලංකාවේ ඇතිවී ඇති ප්‍රශ්ණය මොනයක් ආකාරයකින් හෝ විස්දාගතත් යුතතේ, මේසයක් වටා ඉඳගෙන මිස යුද්ධයකින් නම් නේවාන්නේමය.

කොළොම්පුර සිට විකුම් සත් තතු